OL/2013/11-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

බුද්ධ ධර්මය I,II
பௌத்தம் I,II
Buddhism I,II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## බුද්ධ ධර්මය I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. බුදුරජාණන් වහන්සේගෙන් තමන් විමසූ ප්‍රශ්නවලට මැනවින් පිළිතුරු ලැබුණු පසු, ස්වාමීනි, ඔබ වහන්සේ අන්‍යයන් අසන ප්‍රශ්නවලට පිළිතුරු කල්තියාම සූදනම් කරගෙන සිටින සේක් ද? යනුවෙන් විමසා සිටියේ,
   (1) අභයරාජ කුමාරයා ය.
   (2) බිම්බිසාර රජතුමා ය.
   (3) කොසොල් රජතුමා ය.
   (4) අනේපිඬු සිටුතුමා ය.

2. බුදුරජාණන් වහන්සේ, කුලවත්, ධනවත්, රූමත්, කාමාශාවන් දුරු කළ, විශාල පිරිසකගේ ආචාර්යවරයෙකි. දෙව් බඹුන්ට පවා දහම් දෙසන, කොසොල් රජුගේ ද, ගෞරවාදරයට පාත්‍ර වූ කෙනකු බවත් ඒ නිසා අප උන්වහන්සේ දැකීමට යාම සුදුසු බවත් ප්‍රකාශ කළේ,
   (1) උපාලි ගෘහපතියා ය.
   (2) ඛන්තී ඇමතිවරයා ය.
   (3) වංගී බ්‍රාහ්මණයා ය.
   (4) අම්බට්ඨ බ්‍රාහ්මණයා ය.

3. "දියෙන් උඩට පැමිණ ජලය හා සම්බන්ධ නොවී පවත්නා පියුමක් මෙන් මම ද ලෝකය ඉක්මවා සිටිමි. බමුණ එහෙයින් මා බුද්ධ යැ'යි දැන ගන්න." බුදුරජාණන් වහන්සේ මෙලෙස තමන් හඳුන්වා දුන්නේ,
   (1) හුහුංක බ්‍රාහ්මණයාට ය.
   (2) කසී භාරද්වාජ බ්‍රාහ්මණයාට ය.
   (3) ද්‍රෝණ බ්‍රාහ්මණයාට ය.
   (4) පොට්ඨපාද බ්‍රාහ්මණයාට ය.

4. මව්පියන්ට ගරු නොකරන, පැවිද්දන්ට නොසලකන, කුලදෙටුවන් නොපුදන අදැහැමි සමාජයක් ඇතිවීම පිළිබඳ හේතුඵල න්‍යායට අනුව කරුණු පෙන්වා දෙන්නේ,
   (1) පරාභව සූත්‍රයේ ය.
   (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
   (3) චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.
   (4) මහා මංගල සූත්‍රයේ ය.

5. බෝසතාණන් වහන්සේ උපේක්ෂා පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය හෙළි වන්නේ,
   (1) සීල වීමංස ජාතක කථාවෙනි.
   (2) තේමිය ජාතක කථාවෙනි.
   (3) මඝමානවක ජාතක කථාවෙනි.
   (4) ලෝමහංස ජාතක කථාවෙනි.

6. පාරමිතා පූරන විට සිදු **නොවිය** යුතු කරුණක් වන්නේ,
   (1) පෞද්ගලික ලාභ ප්‍රයෝජන බලාපොරොත්තු වීමයි.
   (2) බුදු බව අරමුණු කිරීමයි.
   (3) ප්‍රඥාවන්ත වීමයි.
   (4) සංසාර සාගරයෙන් එතෙර වීමට සිතීමයි.

7. විකෘතියෙන් ද, ප්‍රමාදයෙන් ද වැළකී, මනා සිහිනුවණින් හැසිරීම මගින් ප්‍රකෘති සිහිය ද, අප්‍රමාදය ද වැඩීමට අදාළ සම්පතම ශික්ෂණය ලැබෙනුයේ,
   (1) ප්‍රාණඝාතයෙන් වැළකීමෙනි.
   (2) අදත්තාදානයෙන් වැළකීමෙනි.
   (3) කාම මිථ්‍යාචාරයෙන් වැළකීමෙනි.
   (4) මත්වතුර, මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකීමෙනි.

8. බුදු දහමෙහි වීර්ය පාරමිතාවට අදාළ ව සඳහන් වන පියවර **තුන** අතුරෙන් පරක්කම ධාතු යනු,
   (1) ආරම්භයේ දී ඇති කර ගත යුතු වීර්යයයි.
   (2) ඉදිරිපත් වීමේ දී ඇති කර ගත යුතු වීර්යයයි.
   (3) බාහිර වස්තූන්ට ආශාවෙන් අත් නොහරින වීර්යයයි.
   (4) යම් දෙයක නිරතවීමේ දී ඇති කර ගත යුතු වීර්යයයි.

9. බෞද්ධ ඉගැන්වීමට අනුව රහත් බව ලැබීමෙන්,
   (1) මේ භවයේ නොමැරී සිටිය හැකියි.
   (2) භවයේ මැරි මැරී උපදින ක්‍රියාවලිය නතර කළ හැකියි.
   (3) ඊළඟ භවයේ සුගතිගාමී විය හැකියි.
   (4) කුසල් රැස්කළ හැකියි.

10. බුදුරදුන් සුභ මානවකයාට පැහැදිලි කර දුන් කරුණු අතර **නොකිපෙන** තැනැත්තා,
   (1) සෝභා සම්පන්න වෙයි.
   (2) තේජස් ඇත්තෙක් වෙයි.
   (3) පොහොසතෙක් වෙයි.
   (4) නීරෝගී වෙයි.

11. තමන් වහන්සේගේ ඇවෑමෙන් ශාස්තෘවරයා ලෙස සැලකීමට බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට අනුදැන වදළේ,
   (1) සූත්‍ර හා අභිධර්ම පිටකයයි.
   (2) ධර්ම විනය දෙකයි.
   (3) ධර්ම ධර-විනය ධර මහ තෙරවරුයි.
   (4) ලෝක පාලක ධර්මයි.

12. සඟ ගුණ ප්‍රකාශ වන තැන "පර ලොව සුව පතා දෙන දනය පිළිගැනීමට සුදුසු ය." යන ගුණය සඳහන් වන්නේ,
   (1) ආහුණෙය්‍යය ලෙසිනි.
   (2) පාහුණෙය්‍යය ලෙසිනි.
   (3) දක්ඛිණෙය්‍යය ලෙසිනි.
   (4) අඤ්ජලිකරණීය ලෙසිනි.

13. වාසෙට්ඨ සූත්‍රයේ දී බුදුරදුන් ප්‍රකට කළ ශ්‍රේෂ්ඨ කරුණ නම්,
   (1) මිනිසා දෙලොව දියුණුව සලසා ගත යුතු බව ය.
   (2) මිනිසා ජාති, කුල වශයෙන් වර්ග කළ නොහැකි බව ය.
   (3) මිනිසා යුතුකම් ඉටු කළ යුතු බව ය.
   (4) නිර්මාණවාදය ප්‍රතික්ෂේප කළ නොහැකි බව ය.

14. බුදු දහමෙහි භෞතික ලෝක විග්‍රහයට අනුව **එක් සක්වළක්** යනු,
   (1) සඳ හිරු දෙදෙනකුගෙන් බැබළෙන ලෝකයකි.
   (2) සඳ හිරු නොමැති ලෝකයකි.
   (3) හිරු පමණක් ඇති ලෝකයකි.
   (4) සඳ හිරු දහස් ගණනක් ඇති ලෝකයකි.

15. "එක් නිවෙසක ස්වාමි-භාර්යා දෙදෙන පරුෂ වචනයෙන් බැණ ගනිමින්, නිතර රණ්ඩු **වෙමින් ජීවත්** වෙති." මේ දෙදෙනාගේ යුග ජීවිතය බුදු දහමට අනුව,
   (1) මළ කඳක් මළ කඳක් හා එකට විසීමකි.
   (2) මළ කඳක් දෙව් දුවක හා එකට විසීමකි.
   (3) දිව්‍ය පුත්‍රයකු මළ කඳක් හා එකට විසීමකි.
   (4) දිව්‍ය පුත්‍රයකු දෙව්දුවක හා එකට විසීමකි.

16. සිත කිලිටි කරන, නිවන් මග අවුරාලන, ක්ලේශ ධර්ම **පහක්** බුදු දහමේ ඉගැන් වේ. ඒවා,
   (1) පංච නියාම ධර්ම නම් වේ.
   (2) පංච නීවරණ ධර්ම නම් වේ.
   (3) පංච ආනන්තරීය ධර්ම නම් වේ.
   (4) පංච දුශ්චරිත ධර්ම නම් වේ.

17. තමන්ට වඩා ගුණ දහමින් උසස් අයකු හෝ සමානයකු හෝ ආශ්‍රයට නොලැබෙන්නේ නම් හුදකලාව විසීම සුදුසු බව අවධාරණය කරමින් දේශනා කළ ධම්ම පද ගාථාවේ මුල් **දෙපදය** වන්නේ,
   (1) "**අත්තානමෙව පඨමං-පතිරූපෙ නිවෙසයෙ**" යන්නයි.
   (2) "යාව ජීවම්පි චෙ බාලො-පණ්ඩිතං පයිරුපාසති" යන්නයි.
   (3) "චරං චෙ නාධිගච්ඡෙය්‍ය-සෙය්‍යං සදිසමත්තනො" යන්නයි.
   (4) "මුහුත්තම්පි චෙ විඤ්ඤූ-පණ්ඩිතං පයිරුපාසති" යන්නයි.

18. චිත්ත-චෛතසිකයන්ගේ අලස බව නිසා ඇති වන කායික හා මානසික කම්මැලිකම, උදාසීන ගතිය බුදු දහමේ හැඳින්වෙන්නේ,
   (1) ව්‍යාපාදය නමිනි.
   (2) ථීන මිද්ධ නමිනි.
   (3) උද්ධච්ච කුක්කුච්ච නමිනි.
   (4) විචිකිච්ඡා නමිනි.

19. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් පරිදි ගුරුවරයා විසින් තම ශිෂ්‍යයාට ඉටු කළ යුතු යුතුකම් ගණයට අයත් නොවන කරුණක් වන්නේ,
   (1) හොඳින් ඉගැන්වීම යන්නයි.
   (2) හිතවතුන්ට හඳුන්වාදීම යන්නයි.
   (3) හැමවිටම ආරක්ෂාවරණය සැපයීම යන්නයි.
   (4) විපතේ දී අත් හැර නොයෑම යන්නයි.

[ තුන්වැනි පිටුව බලන්න.

20. ධර්ම සාහිත්‍යය රැකගැනීමට ශ්‍රී ලාංකේය භික්ෂූන් ඉටු කළ ඓතිහාසික සංගායනාව නිසා,
(1) ධර්මය පළමුවරට ලේඛන ගත කෙරිණි.
(2) නිකාය භේදයට අනුමැතිය ලැබිණි.
(3) විහාර, ආරාම පෞද්ගලිකව ම පිළිගැනීමට භික්ෂූන්ට අවසර ලැබිණි.
(4) මහාතිස්ස හිමියන් සංඝ සමාජයෙන් ඉවත් කෙරිණි.

21. "කුසල්-අකුසල් රැස්කිරීම හෙවත් සංස්කාර ඇති කල්හි විඤ්ඤාණය ඇති වේ." මෙය ප්‍රකාශ වන්නේ,
(1) "අවිජ්ජා පච්චයා සංඛාරා" යන්නෙනි. (2) "සංඛාර පච්චයා විඤ්ඤාණං" යන්නෙනි.
(3) "විඤ්ඤාණ පච්චයා නාමරූපං" යන්නෙනි. (4) "නාමරූප පච්චයා සළායතනං" යන්නෙනි.

22. ස්තූපයක් නිර්මාණයේ දී ආසනය තැනීමෙන් පසු අනුගමනය කළ යුතු නිවැරදි පිළිවෙළ ලෙස සැලකෙන්නේ,
(1) ගර්භය, පේසා වළලු, හතරැස් කොටුව, දේවතා කොටුව වශයෙනි.
(2) පේසා වළලු, ගර්භය, හතරැස් කොටුව, දේවතා කොටුව වශයෙනි.
(3) පේසා වළලු, ගර්භය, දේවතා කොටුව, හතරැස් කොටුව වශයෙනි.
(4) ගර්භය, දේවතා කොටුව, පේසා වළලු, හතරැස් කොටුව වශයෙනි.

23. වංස කථාවල සඳහන් පරිදි ලක්දිව ඉදිකළ ප්‍රථම ස්තූපය හා මහින්දගමනයෙන් පසු ඉදි වූ ප්‍රථම ස්තූපය වන්නේ,
(1) මහියංගන ස්තූපය හා ථූපාරාම ස්තූපයයි. (2) මහියංගන ස්තූපය හා ගිරිහඬු සෑයයි.
(3) ථූපාරාම ස්තූපය හා මිරිසවැටිය ස්තූපයයි. (4) ථූපාරාම ස්තූපය හා රුවන්වැලි සෑයයි.

24. කුරුණෑගල යුගයෙහි රචිත ව සිංහල ජන ජීවිතයට බලපෑ අසහාය සාහිත්‍ය කෘතිය නම්,
(1) අමාවතුරයි. (2) පන්සිය පනස් ජාතක පොතයි.
(3) සද්ධර්ම රත්නාවලියයි. (4) පූජාවලියයි.

25. විපාකදීමට ඉදිරිපත් වන අනුපිළිවෙළ අනුව යම් පුද්ගලයකු විසින් සිදු කරනු ලබන වඩාත් ම බරපතල යහපත් හෝ අයහපත් හෝ කර්ම,
(1) ගරුක කම්ම නම් වේ. (2) ආසන්න කම්ම නම් වේ.
(3) ආචිණ්ණ කම්ම නම් වේ. (4) කටත්තා කම්ම නම් වේ.

26. "කම්මනා වසලො හොති - කම්මනා හොති බ්‍රාහ්මණො" මෙමගින් පැහැදිලි වන්නේ,
(1) පූර්ව කර්මානුකූලව වසලයකු වන බව ය. පූර්ව කර්මානුකූලව බ්‍රාහ්මණයකු වන බව ය.
(2) ක්‍රියාවෙන් වසලයකු වන බව ය. ක්‍රියාවෙන් බ්‍රාහ්මණයකු වන බව ය.
(3) වසල යනු රැකියාවක් වන බව ය. බ්‍රාහ්මණ යනු රැකියාවක් වන බව ය.
(4) වසල යනු කුල පරපුරක් වන බව ය. බ්‍රාහ්මණ යනු කුල පරපුරක් වන බව ය.

27. සත්ත්ව ඝාතනයෙන්, මත්ද්‍රව්‍ය නිෂ්පාදනයෙන් මිල මුදල් උපයාගත් කෙනකුට අහිමි වන සැපය ලෙස බුදු දහමෙහි දක්වෙන්නේ,
(1) අත්ථි සුඛයයි. (2) භෝග සුඛයයි.
(3) අණන සුඛයයි. (4) අනවජ්ජ සුඛයයි.

28. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙහි සඳහන් වන "සමජීවිකතා" යන්නෙන් අදහස් කෙරෙන්නේ,
(1) අය-වැය සමව දන ක්‍රියා කිරීම බෞද්ධ පිළිවෙත බවයි.
(2) සැමදෙනා අතරේ සමසේ දේපළ බෙදා හදා ගැනීම යහපත් බවයි.
(3) සැමදෙනා සමගියෙන් හා සමාදානයෙන් ජීවත් වීම යහපත් බවයි.
(4) දැහැමි ලෙස අඹු දරුවන් සමඟ ජීවත් වීම යහපත් බවයි.

29. සප්ත අපරිහානීය ධර්මවලට අයත් **නොවන්නේ**,
(1) නිතර නිතර රැස්වීමයි. (2) සියලු රටවැසියන් තම දරුවන් සේ සැලකීමයි.
(3) වැඩිහිටියන්ට ගරු කිරීමයි. (4) විවාහ නොවූ කුල කුමරියන්ට ආරක්ෂාව සැලසීමයි.

30. බුදු ගුණ දකියි, එහි සිත බැඳී පවතී. දහම් ගුණ දකියි, එහි සිත බැඳී පවතී. සඟ ගුණ දකියි, එහි සිත බැඳී පවතී. එවිට ඔහුගේ හෝ ඇයගේ සිත තුළ වැඩෙන්නේ,
(1) ශ්‍රද්ධාවයි (2) ශ්‍රැතියයි. (3) චාගයයි. (4) අලසකමයි.

248801

31. කාලාම සූත්‍රයෙන් බුදුරදුන් අනුදත් කරුණ නම්,
   (1) මානව විප්ලවයයි.
   (2) සමාජ පරිණාමයයි.
   (3) නිදහස් චින්තනයයි.
   (4) නිවහල් ජාතිකත්වයයි.

32. සත්ත්වයාගේ සසර දුක ඇතිවීම හා දුක නැති කිරීම පෙන්වා දීමට බුදුරජාණන් වහන්සේ උපයෝගී කරගත්තේ,
   (1) අනාත්ම වාදයයි.
   (2) පුබ්බේ කත හේතු වාදයයි.
   (3) පටිච්ච සමුප්පාදයයි.
   (4) අහේතු අප්‍රත්‍යය වාදයයි.

33. කාමය, හිංසනය, හා ක්‍රෝධය යන කරුණුවලින් බැහැරවීම අරි අටඟි මඟෙහි දැක්වෙන්නේ,
   (1) සම්මා දිට්ඨි නමින් ය.
   (2) සම්මා සංකප්ප නමින් ය.
   (3) සම්මා සති නමින් ය.
   (4) සම්මා සමාධි නමින් ය.

34. ප්‍රථම ධර්ම සංගීතියේ දී විනය පිටකය කට පාඩමින් රැකගෙන ඒමට පැවරුණේ,
   (1) උපාලි මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පරපුරටයි.
   (2) ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පරපුරටයි.
   (3) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පරපුරටයි.
   (4) අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රධාන ශිෂ්‍ය පරපුරටයි.

35. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර සියයකට පසුව ධර්ම සංගායනාවක් පැවැත්වූයේ,
   (1) රජගහනුවර සප්ත පර්ණි ගුහාවේ දී ය.
   (2) පාඨලි පුත්‍ර නගරයේ අශෝකාරාමයේ දී ය.
   (3) විශාලා මහනුවර වාලුකාරාමයේ දී ය.
   (4) කාශ්මීරයේ කුණ්ඩල වනයේ දී ය.

36. තෙවැනි ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට අයත් නොවන කරුණක් වන්නේ,
   (1) නවරට සසුන් පිහිටුවීම යන්නයි.
   (2) දුසිල් මහණුන් සසුනෙන් නෙරපීම යන්නයි.
   (3) කථාවත්ථුප්පකරණය සම්පාදනය වීම යන්නයි.
   (4) දස වස්තු ප්‍රතික්ෂේප වීම යන්නයි.

37. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවා බෞද්ධ පාසල් ආරම්භ කිරීමට කටයුතු කළේ,
   (1) පූජ්‍ය මිගෙට්ටුවත්තේ ශ්‍රී ගුණානන්ද හිමි ය.
   (2) වලිසිංහ හරිශ්චන්ද්‍රතුමා ය.
   (3) සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය.
   (4) අනගාරික ධර්මපාලතුමා ය.

38. ශ්‍රී ලාංකේය ශාසන ඉතිහාසයේ පළමුවරට පෞද්ගලික ආරාම පූජාවක් සිදු කළේ,
   (1) දේවානම්පිය තිස්ස රජතුමා ය.
   (2) වළගම්බා රජතුමා ය.
   (3) දුටුගැමුණු රජතුමා ය.
   (4) මහසෙන් රජතුමා ය.

39. ශ්‍රී ලංකාවේ කුඩා ප්‍රමාණයේ ස්තූපවල ආරක්ෂාව සඳහා එය මැදිකොට තනා ඇති ගොඩනැගිල්ල,
   (1) වාහල්කඩ නමින් හැඳින්වේ.
   (2) චෛත්‍යඝර නමින් හැඳින්වේ.
   (3) පටිමාඝර නමින් හැඳින්වේ.
   (4) පධානඝර නමින් හැඳින්වේ.

40. වර්ෂ 1822 දී එංගලන්තයේ පාලි පොත් සමාගම පිහිටුවා පාලි පොත් ඉංග්‍රීසි බසට පරිවර්තනය කිරීමට කටයුතු කළේ,
   (1) ගයිගර් මැතිතුමා ය.
   (2) ආනන්ද කුමාරස්වාමි මැතිතුමා ය.
   (3) මැක්ස්මුලර් මැතිතුමා ය.
   (4) රිස් ඩේවිඩ්ස් මැතිතුමා ය.

**

The National Learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2013 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2013 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2013

බුද්ධ ධර්මය I, II
பௌத்தம் I, II
Buddhism I, II

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20**ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) මහාභිනිෂ්ක්‍රමණයෙන් පසු සිදුහත් තාපසතුමා සත්‍යය සොයා ගිය ආචාර්යවරුන් **දෙදෙනා** නම් කරන්න.

(ii) බුදුරජාණන් වහන්සේට පූජා කළ මුල් ම ආරාමය කුමක් ද? එය පූජා කෙළේ කවුරුන් විසින් ද?

(iii) "මේ ලෝකයේ වෛරයෙන් වෛරයෝ නොසන්සිඳෙති" මේ අදහස ඇතුළත් ධම්ම පද ගාථා පාඨය ලියන්න.

(iv) "අනුන්ගේ සිත දැන ගැනීමට හැකි නුවණ" බුදු දහමෙහි දක්වා ඇත්තේ කවර නමකින් ද?

(v) වරක් දෙවියෙකු බුදුරදුන් වෙත පැමිණ "මිනිස්සු අවුලෙන් අවුලට පත්ව සිටිති" යි දන් වූ විට එම අවුල් විසඳ ගැනීමේ ආරම්භක පියවර ලෙස උන්වහන්සේ දක්වූයේ කුමක් ද?

(vi) "නිවන" යන පදයෙහි කෙටි අදහස ලියන්න.

(vii) පටිච්ච සමුප්පාද ධර්ම විග්‍රහයට අනුව සත්ත්වයා, ජරා, මරණ, සෝක පරිදේව ආදියට පත්වන්නේ කවර හේතුවක් නිසා ද?

(viii) බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේ දී පෙරදිගට (නැගෙනහිර) හා දකුණු දිගට උපමා කළේ කවුරුන් ද?

(ix) 'ඵුට්ඨස්ස ලොක ධම්මෙහි - චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං - එතං මංගලමුත්තමං' මේ ගාථාවේ අදහස ලියන්න.

(x) ලෝකය දුක් සහිත වුව ද, අපට ඉන් මිදීමේ හැකියාව ඇත. මේ පිළිබඳ ව බුදුරජාණන් වහන්සේ දේශනා කළ ශ්‍රේෂ්ඨතම මාර්ගය කුමක් ද?

**2.** පාසලේ බෞද්ධ සංගමයේ ආරාධනයෙන් එහි වැඩම කළ ගරුතර ස්වාමීන් වහන්සේ සිල් සමාදන් වී සිටි සිසු පිරිස අමතා මෙසේ පැවසූ හ.

'ධර්මය අවබෝධ කොට ලොවට දේශනා කළ බුදුරජාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ ව ද , මේ දූ දරුවන් මනා අවබෝධයක් ලබා ගන්න ඕනැ. බුදුසිරිතේ ප්‍රධාන සිදුවීම් මෙන් ම ශ්‍රේෂ්ඨ ආදර්ශ ද අප හොඳින් තේරුම් ගත යුතුයි."

(i) සිදුහත් උපත හා බුද්ධ පරිනිර්වාණය සිදු වූ ස්ථාන **දෙක** නම් කරන්න.

(ii) පස්වග මහණුන්ගෙන් ඇරඹි භික්ෂු ශාසනය හැටනමක් දක්වා ව්‍යාප්ත වූ අයුරු පෙන්වා දෙන්න.

(iii) බුදු සිරිතෙහි සඳහන් ඉවසීම හා අසරණ සරණ ගුණය ඔබගේ ජීවිතය යහපත් කර ගැනීමට කොතෙක් දුරට ඉවහල් වේ ද'යි දක්වන්න.

**3.** (i) "සියලු පව් නොකළ යුතු" යැ'යි සඳහන් බුදුවරුන්ගේ අනුශාසනා දක්වෙන ධම්ම පද ගාථාව ලියන්න.

(ii) සිත පිරිසිදු කිරීම යන්නෙහි සරල අදහස දක්වන්න.

(iii) පුද්ගලයකුගේ කායික සංවරය හෙවත් කයෙන් සිදුවන අකුසල්වලින් මිදීමෙන් ප්‍රීතිමත් සමාජයක් ගොඩනැගීමට හැකි වන ආකාරය විස්තර කරන්න.

**4.** (i) දසරාජ ධර්ම අතුරෙන් **දෙකක්** නම් කරන්න.

(ii) දැහැමි රාජ්‍ය පාලනයක් සඳහා ඉවහල් වන රාජ ධර්ම **තුනක්** ලියන්න.

(iii) රාජ්‍ය පාලන තන්ත්‍රයක් යටතේ රටක් දැහැමි වන්නේ කෙසේ ද'යි දසරාජ ධර්ම ඇසුරෙන් පෙන්වා දෙන්න.

5. (i) දැහැමි ආර්ථික ක්‍රම පිළිබඳ සඳහන් වන සූත්‍ර දේශනා **දෙකක්** නම් කරන්න.
(ii) වෙළඳාමේ දී අත්හළ යුතු කූටෝපක්‍රම **තුනක්** දක්වන්න.
(iii) ධන පරිහරණයේ දී "සමජීවිකතාවෙන් යුතුව" ධනය වැය කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ මොනවා දැ'යි පැහැදිලි කරන්න.

6. (i) "චේතනාහං භික්ඛවෙ කම්මං වදාමි" මෙහි අර්ථය පැහැදිලි කරන්න.
(ii) විපාක දෙන කාලය අනුව කර්මය සතර ආකාර වේ. ඉන් **තුනක්** නම් කරන්න.
(iii) සියල්ල සිදුවන්නේ පෙර කරන ලද කර්මයෙන් ම දැ'යි පැහැදිලි කරන්න.

7. (i) ස්තූපවල ආකෘතිය අනුව කොටස් හයකට බෙදා ඇත. ඉන් **දෙකක්** නම් කරන්න.
(ii) අනුරාධපුරයේ පිහිටි ඉපැරණි ස්තූප **තුනක්** නම් කොට, ඒවා ගොඩනැගූ රාජ්‍ය පාලකයන් දක්වන්න.
(iii) සර්වඥයන් වහන්සේගේ ශාරීරික ධාතු වන්දනාව උදෙසා ශ්‍රී ලාංකේය බෞද්ධයන් දක් වූ උනන්දුව හා සැලකිල්ල නිදසුන් මගින් පෙන්වා දෙන්න.

***

The National e-learning Portal for The General Education